මනුෂ්‍ය ඝාතනයක් හා බැඳි දිවි අහිමි කරගැනීමේ සිදුවීමකට ඉහළ මාධ්‍ය අවධානයක් ලැබෙන බැවින්, එවැනි සිදුවීමක් වාර්තා කිරීමේදී පවා දිවි අහිමි කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීම අත්‍යාවශ්‍ය වේ.

පසුගිය දිනක මවක් සිය දරුවාව මරණයට පත් කොට තමන්ද දිවි අහිමි කොටගත් පුවතක් සිංහල භාෂා පුවත්පත් තුළ ආවරණය වී තිබූ ආකාරය නිරීක්ෂණය කිරීමේදී, දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් ගණනාවක් දැකිය හැකි වේ.

මෙම පුවත දෙරණ අරුණ, හිරු පත්තරේ විස්තරේ සහ ස්වර්ණවාහිනී පත්තරේ යන වැඩසටහන් තුළද දැක්වුණු අතර, දිවි අහිමි කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවන ලෙසින් මෙවැනි පුවතක් එම වැඩසටහන් තුළ ඉදිරිපත් වීම ඔස්සේද, මෙයට වඩාත් පුළුල් ප්‍රචාරයක් ලැබෙනා බවද මෙසේම පැවසීමට සිදුවේ.

අප නිරීක්ෂණය කළ ඉංග්‍රීසි භාෂා පුවත්පත් අතරින් මෙම පුවත පළ කර තිබූ එකම පුවත්පත වන සිලෝන් ටුඩේහි (01/26) පුවත් වාර්තාව තුළ "committed suicide" යනුවෙන් දැක්වී තිබුණි. ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීම අපරාධයක් ලෙසින් හැඟවේ. එසේම සිලෝන් ටුඩේ ලිපිය සමග උපකාරක අංකද සඳහන් වී නොතිබුණි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
මූලාශ්‍ර:
https://media.samaritans.org/documents/Media_Guidelines_FINAL_v2_TABa8C6.pdf
https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting
https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1
#MediaEthicsSL #lka #EnglishPress #SinhalaPress #CeylonToday #Mawbima #Divaina #Aruna